**ශීර්ෂය - 151 ධීවර අමාත්‍යාංශය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය 2020 අගෝස්තු 31 දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව සැසඳීමට නොහැකි බව මා ප්‍රකාශ කරමි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

---

**ආදායම් නොවන ලැබීම්**

---

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.9,587,110ක් දක්වා තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව (එස්ඒ-52) අත්තිකාරම් ලැබීම් රු.3,994,958 ක් වූයෙන් රු.5,592,152 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාශයෙහි පෙන්වනුයේ 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ධීවර අමාත්‍යාංශය යටතේ ගිණුම්ගත වූ ලැබීම් ප්‍රමාණය පමණක් බව. | විධිවිධාන ප්‍රකාරව මුළු අත්තිකාරම් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |
| (ii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් ගෙවීම් රු.7,433,796ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව (ඒස්ඒ-52) අත්තිකාරම් ගෙවීම් රු.27,946,768 ක් වූයෙන් රු.20,512,972 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාශයෙහි පෙන්වනුයේ 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ධීවර අමාත්‍යාංශය යටතේ ගිණුම්ගත වූ ගෙවීම් ප්‍රමාණය පමණක් බව. | විධිවිධාන ප්‍රකාරව මුළු අත්තිකාරම් ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

---

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල ACA-6 වාර්තාවේ 2020 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.523,782,990 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය (එස්ඒ-82) අනුව එවැනි ආරම්භක වත්කම් ශේෂ වටිනාකමක් දක්වා නොතිබුණි. | මේ වන විට එම නිවැරදි කිරීම් සිදු කර ඇති බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.605,570,552ක් ලෙස දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර වාර්තාවේ (එස්ඒ-82) රු.57,290,189ක් ලෙස දක්වා තිබුණෙන් රු.548,280,363ක වෙනස සසඳා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට එම නිවැරදි කිරීම් සිදු කර ඇති බව. | -එම- |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය ACA -6 පරීක්ෂා කිරීමේදී 2020 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් එකතුව රු.81,787,561ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම් රු.81,982,353ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.194,792ක වෙනසක් විය. | රු.194,792 ක වටිනාකම සහිත ස්ථාවර වත්කමක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් නොවීම මෙයට හේතු වී ඇති බව හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති අගය නිවැරදි බව. | -එම- |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.13 ඡේදය ප්‍රකාරව ගිණුම් සාරාංශ මඟින් වාර්තා කරන ලද ස්ථාවර වත්කම්හි උපලේඛනයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් වර්ෂය තුල අත්පත් කරගත් රු.81,982,353ක වත්කම් පිළිබඳව උපලේඛනයක් ඉදිරිපත් කළ බවට තොරතුරු නොවිය. | ඒසීඒ- 06 ආකෘතියේ පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව. | -එම- |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමාත්‍යාංශය පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ශේෂ පිරික්සුම සැසඳීමේදී අයිතම 09ක වටිනාකම් අතර එකතුව රු.2,077,438,762ක වෙනස්කමක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඍජු මුදල් පදනම මත සහ මුළු වර්ෂයටම අදාළ වන බව හා ශේෂ පිරික්ෂුම අවසාන මාස 04ට අදාළව උපචිත පදනමට බව. | නිවැරදිව ශේෂ පිරික්සුම පිළියෙල කර ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වේ. |

**1.6.4 තැන්පතු**

----------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 2 ක ඉක්ම වූ රු.1,625,268 ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | වර්ෂ 02ක කාල සීමාව ඉක්ම වූ තැන්පතු වලින් රු.362,098.47ක ප්‍රමාණයක් 2021 මාර්තු මස රජයේ ආදායමට බැර කර ඇති අතර ඉතිරි තැන්පතු මුදල් ද අවශ්‍ය සනාථ කිරීම් ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු කරනු ලබන බව. | පරීක්ෂා කර බලා ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වේ. |

**1.6.5 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සෘජුවම භාණ්ඩාගාරයෙන් වැය කර තිබුණු රු.43,399,817 ක් වෙනත් මූලධන වියදම් යටතේ දක්වා තිබුණ ද එම ව්‍යාපෘතියේ 2020 මූල්‍ය ප්‍රකාශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මූල්‍යනය කළ ණය ප්‍රමාණය රු.19,044,912ක් පමණක් වූයෙන් රු.24,354,905ක වෙනසක් නිරීක්ෂණය විය. තවද විදේශ ණය යටතේ වියදම් කළ රු.43,399,817ක් සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වීම නිසා විගණනයේදී ඒවා සතුටුදායකව සත්‍යාපනය කළ නොහැකි විය. | අමාත්‍යාංශ ලෙජරයේ ද භාණ්ඩාගාරයේ සෘජුව වැය කර ඇති මෙම රු. 43,399,817 පිළිබඳ සටහන් කර ඇති බව. | වැය කිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් පැලියගොඩ මත්ස්‍ය වෙළඳ සංකීර්ණය නැවත ආරම්භ කිරීම සඳහා සංවර්ධන සහයන් යටතේ හදිසි ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ලබා දුන් රු.50,000,000ක් වියදම් කිරීම පිළිබඳව පසුවිපරම් සිදුකළ බවට තොරතුරු නොවීය. | මෙම රු.මිලියන 50 ක මුදල උප අග්‍රිමයක් වශයෙන් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය වෙත ලබා දී ඇති බව හා අග්‍රිම වියදම් කිරීම පිළිබඳ තොරතුරු මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සතු වන බව. | අමාත්‍යාංශය විසින් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරගැනීම සිදුකළ යුතු අතර පසුවිපරම් කටයුතු සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල තැන්පතු ලැබීම් හා ගෙවීම් ද අංක විස්තර සඳහන් නැති තැන්පතු ලැබීම් ද ඇතුළු රු.60,114,465ක්වූ මුළු ලැබීම් හා රු.277,753,372ක්වූ මුළු ගෙවීම් සඳහා විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | ධීවර අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශයට අයත් පොදු තැන්පත් රැඳවුම් සියල්ල ධීවර අමාත්‍යාංශ ගිණුමේ පැවති අතර එම තැන්පතු ආයතන දෙක අතර සිගාස් වැඩසටහන මඟින් මාරු කර ගැනීමට අමාත්‍යාංශයට පහසුකම් සලසා නැති බව හා එම කටයුත්ත මහා භාණ්ඩාගාරය මඟින් සිදුකළ බව. | අදාළ සියලු තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ) | මුදල්රෙගුලාසි 272(3) ප්‍රකාරව ධීවර අමාත්‍යාංශයේ 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල රු. 265,704,593 ක වියදමට අදාල ගෙවීම් වවුචර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින් එම වියදම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | මුදල්රෙගුලාසි 272(3) ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර විගණකාධිපති වෙත එවිය යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ------------- |
| සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සොයාබැලීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් දිවයිනේ විවිධ ප්‍රදේශවල වැඩි වශයෙන් රාජකාරියන්හි යෙදවීමට රු 3,272,824ක් වැය කර තිබුණ ද වර්ෂය අවසන් වී මාස 7 ක් ඉකුත්ව ඇතත් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 අමාත්‍ය කාර්යාල ව්‍යාපෘතිය යටතේ 1101 ගමන් වියදම් වැය විෂය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනය අදාළ වියදම් ගිණුම්ගත කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව හා 2020 ට අදාල ප්‍රගතිය අදාල වාර්තා සමඟ ඉදිරිපත් කරන බව. | ගමන් වියදම් සඳහා වැයකළ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉදිරිපත් කළ යුතු වේ. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------- | ------------- |
| ධීවර අමාත්‍යාංශයේ ධීවර ප්‍රජාව බලගැන්වීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.23,870,000ක ප්‍රතිපාදන සලසාගෙන එයින් රු.23,791,914ක් වැය කර තිබුණු අතර තවත් රු. 4,979,666ක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වර්ෂයට අදාළ මුළු ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන අඩුවෙන් ලබා දීම මත ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇති කර ගැනීමක් නිරීක්ෂණය වුවද ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදම් දැරීමක් සිදු නොවුන බව. | ප්‍රතිපාදන මත පමණක් වියදම් සඳහා බැදීම් ඇතිකර ගත යුතු වේ. |

වෙත ගෙවීමට බැඳීම් ඇතිකරගෙන තිබුණි. ප්‍රතිපාදන ඉතිරිය රු.78,086ක් වීම නිසා මෙම බැඳීමත් සමඟ රු.4,901,580ක ප්‍රතිපාදන ඉක්මවීමක් නිරීක්ෂණය විය.

**2.3 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට අදාල කාර්යසාධන සුරක්ෂණය හා අත්තිකාරම් සුරක්ෂණය 2019 සැප්තැම්බර් 12 දින මුදල් කරගැනීමෙන් ලැබුණු රු.55,677,614 ක මුදල රාජ්‍ය ආදායමට සෘජුවම ගත යුතුව තිබුණ ද වර්ෂයකට වැඩි කාලයක් ඉකුත්ව ඇතත් රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි. | මෙම මුදල පොදු තැන්පතු ලේඛනයේ තාවකාලිකව රඳවා ගෙන ඇති අතර අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරියේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් වූ අත්තිකාරම් සුරක්ෂනයේ මුදල රාජ්‍ය ආදායමට ගත යුතු වේ. |

**2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ධීවර අමාත්‍යාංශය මනා මූල්‍ය පාලනයක් සහ අභ්‍යන්තර පාලනයක් ඇති කරනු පිණිස මු.රෙ 135 යටතේ බලතල බෙදීම සිදු කර ඇති බවත් නිලධාරීන් අතර වැඩ පැවරීම ද නිසි ලෙස සිදු කර ඇති බවත් කොවිඩ් ව්‍යාසන තත්වයේ වුවද විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් වර්ෂය තුළ පවත්වා ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ විගණන විමසුම් 07 කට පිළිතුරු ලබා දී නොතිබුණි. | කොවිඩ් වසංගත තත්වය යටතේ වැඩ කටයුතු කිරීමට සිදු වූ බැවින් විගණන විමසුම් 07 ක පිළිතුරු සැපයීම ප්‍රමාද වුවද කඩිනමින් එම කටයුතු සිදු කරන බව. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය සඳහා ධීවර ප්‍රජාව බලගැන්වීම වෙනුවෙන් රු.23,870,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනවන විට වැයකර තිබුණු රු.23,791,974 කින් රු.22,291,974ක් 2019 වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපෘතින්හි අතැති බිල්පත් පියවීම සඳහා උපයෝජනය කර තිබුණි. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල අතැති බිල්පත් පියවීම සඳහා 2020 වර්ෂය සඳහා වෙන් කර දුන් ප්‍රතිපාදන උපයෝජනය කරන ලද බව. | 2020 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කිරීම අදාල වර්ෂයේ කාර්යයන්ට භාවිතා කළ යුතු වේ. |
| (ආ) | 2020 ක්‍රියාකාරි සැලැස්ම අනුව ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අපේක්ෂා කර තිබූ ඉස්සන් නිරෝධායන පහසුකම් ඇති කිරීම (මූලික කටයුතු) හා මුහුදු කූඩැල්ලන් ගම්මානය සඳහා මැණුම් කිරීම යන කාර්යයන් සිදුකිරීමට රු.2,700,000ක්වූ ප්‍රතිපාදන 2020 දෙසැම්බර් 31 දින වනවිටත් උපයෝජනය කර නොතිබුණි. | මූලිකව ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව යෝජිත සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිපාදන යොදා කාර්යයන් සිදුකළ යුතු වේ. |
| (ඇ) | ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (53-2506) සඳහා 2020 වර්ෂයේ ධීවර අමාත්‍යාංශයට වෙන්කළ රු.33,630,000ක ප්‍රතිපාදනයෙන් රු.31,961,270 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට මත්ස්‍ය බීජ නිෂ්පාදනය (Fish Seed Production) ඉහළ නැංවීම සඳහා වැය කර තිබුණ ද ඉලක්ක කරන ලද කාර්යය සිදුවී ඇත් ද යන්න පිළිබඳව පසුවිපරම් කිරීමක් කර නොතිබුණි. | පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන වැයකළ ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා වෙරළ සුරක්ෂණය හා සම්පත් කළමනාකරණය කිරීමේ වැඩසටහන යටතේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.44,500,000 ක ප්‍රතිපාදනයක් අමාත්‍යාංශයට වෙන්කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට වියදම රු.27,290,360ක් විය. 2020 ක්‍රියාකාරි සැලැස්ම අනුව අදාල ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා ජලජීවි වගා සංවර්ධන අධිකාරිය මන්නාරම් දිස්ත්‍රික්කයේ මුහුදු කූඩැල්ලන් සඳහා අභිජනනාගාර ඉදිකිරීම, පුත්තලම දිස්ත්‍රික්කයේ විසිතුරු මසුන් සඳහා අභිජනනාගාර ඉදිකිරීම හා පම්බල මිරිදිය ඉස්සන් අභිජනනාගාර වැඩි දියුණු කිරීම යන කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කර තිබුණි. ඉදිකිරීම් කටයුතුවල මූල්‍ය ප්‍රගතිය සියයට 61 ක් වූ අතර ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත නිමැවුම ලැබී තිබුණේ ද යන්න ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් ද සිදු කර නොතිබුණි. | පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව සිදුකළ ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කළ යුතු වේ. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මේ වන විට පිළියෙළ කර අවසන් කර ඇති අතර විගණන මතය ලද වහාම එය පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කෘෂි රක්ෂණ මණ්ඩලය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව දිස්ත්‍රික් ධීවර ව්‍යාපෘති නිලධාරීන් වෙත 1991 මාර්තු | පිළිතුරු ලබාදී නැත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව මෙම යෝජනා ක්‍රමය |

| | | | |
|---|---|---|---|
| | 19 දින නිකුත් කළ චක්‍රලේඛය අනුව ධීවරයින් සඳහා වූ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු මන්දගාමීව හා යාවත්කාලීනව සිදුනොවන ස්වරූපයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | | යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. |
| (ආ) | ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා වාර්ෂිකව රු.1,500,000 ක් බැගින් වැය කර තිබුණ ද එම ක්‍රමයට නව ධීවරයින් බඳවා ගැනීම වර්ෂ 7 ක කාලයක් තිස්සේ සිදුවී නොතිබුණු අතර මෙම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකවන ධීවරයින්ගේ නාම ලේඛනයක් ද අමාත්‍යාංශය පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකවන ධීවරයින්ගේ නාම ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |
| (ඇ) | ලංකා බැංකුවේ මෙට්රොපොලිටන් ශාඛාවේ සේප්පුවේ යතුරු අස්ථානගත වී 2012 වර්ෂයේ සිට අක්‍රියව තිබූ අතර මෙම සේප්පුවේ යතුර වෙනුවෙන් රු.7,000ක ගාස්තුවක් හා හිඟහිටි බදු කුලී වශයෙන් රු.66,656ක් සමඟ එකතුව රු.73,656ක් ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. එම මුදල හඳුනාගන්නා ලද මූල්‍ය අලාභයක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ. තව ද මේ පිළිබඳව මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු කර අලාභයට වගකිව යුතු නිලධාරීන්ගෙන් මෙම මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණු අතර වගකිව යුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල මත සිදුවී තිබුණු එම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව ද කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව අදාළ හිඟ මුදල් ගෙවීමට පෙර වගකිව යුතු නිලධාරීන් පිළිබඳව සොයා බැලීමක් සිදුකරන ලද බවත් සේප්පුව සම්බන්ධයෙන් ලංකා බැංකුව සමඟ ගිවිසුම් අත්සන් කළ එවකට ධීවර අමාත්‍යාංශයේ සේවය කළ නිලධාරි මහතා මේ වන විට ජීවතුන් අතර නොමැති අතර අදාළ යතුරු ද අස්ථානගත වී ඇති බව. ලංකා බැංකුවෙන් දැනුම්දීමක් කරන තෙක් එම සේප්පුව කුලියට ගෙන ඇති බවක් අමාත්‍යාංශයේ වත්මන් නිලධාරීන් දැනුවත්ව නොසිටි බැවින් මෙම හිඟ මුදල් ගෙවීමට සිදුව ඇති බව. | මුදල් රෙගුලාසි 103(1) හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | දිනමිණ සහ තිරකරන් පුවත්පත්වල පළකිරීමට අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ඔරුවැල්ල පුවත්පත මුද්‍රණය කිරීම සඳහා 2020 වර්ෂයේ දී රු.7,290,000 ක් ගෙවා තිබුණි. වර්ෂ ගණනාවක සිට මෙවැනි පුවත්පත් මුද්‍රණය කර ඒ සඳහා ගෙවීම් කර තිබුණ ද එම පුවත්පත පළ කිරීමේ අරමුණු හා ලඟා කරගත් ඉලක්ක පිළිබඳ පසුවිපරම් කිරීමක් හෝ මෙහෙයුම් සමාලෝචනයක් කර තිබුණු බවට තොරතුරු අනාවරණය නොවීය. | 2018 නොවැම්බර් සිට මුද්‍රණය නතර කර තිබුණු බවත් 2020 ජනවාරි සිට නැවත මුද්‍රණය කළ බවත් පුවත්පත පළකිරීමේ අරමුණු, ඉලක්ක ළඟා කරගෙන ඇද්ද යන්න පිළිබඳ පසුවිපරම් කිරීමට එම කෙටි කාලය තුළ හැකියාවක් නොතිබුණු බවත් ඉදිරියේ දී එසේ කිරීමට සටහන් කරගන්නා බව. | පුවත්පත මුද්‍රණය කිරීමෙන් අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ පසුවිපරමක් සිදුකළ යුතු වේ. |